# සීමාසහිත මොරවක් කෝරළේ තේ නිපදවන්නන්ගේ

# සමුපකාර සමිතිය - කොටපොළ

# අයදුම්පත් කැඳවීම.

## නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) තනතුර (III ශ්‍රේණිය)

අප සමිතියේ දැනට අනුමත නව පිරිස්බල තක්සේරුව අනුව පුරප්පාඩුව පවතින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (පරිපාලන) තනතුරට බඳවා ගැනීම සඳහා පහත අනුමත සුදුසුකම් සපුරන අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම් :** (I) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ්‍ය, කළමනාකරණ, ගණකාධිකරණ, ආර්ථික විද්‍යා යන ක්ෂේත්‍රයට අදාළ උපාධියක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05කට නොඅඩු පළපුරුද්ද /පුහුණුව ලබා තිබීම.

හෝ

(II) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම උපාධියක් ලබා තිබීම සහ රජයේ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයට අදාළ වසර 01 කට නොඅඩු ඩිප්ලෝමාවක් ලබා තිබීම සහ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රය පිළිබඳ වසර 05කට නොඅඩු පළපුරුද්ද/ පුහුණුව ලබා තිබීම.

හෝ

(III) EL-3 මට්ටමේ I ශ්‍රේණියේ තනතුරක සේවය කිරීම හෝ EL - 3 මට්ටමේ II ශ්‍රේණියේ තනතුරක වසර 04කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**වේතන අංකය** : EL - 2

**වැටුප් පරිමාණය** : 26,000-760X5-840X5-920X10-1,000X10-1,080X12-66,160

සහ

දි.ප. සමුපකාර සේවක කොමිෂන් සභාව මගින් අනුමත කර ඇති දීමනා.

**වෙනත් දීමනා** : වැටුපට අමතරව සමිති කාර්යය මණ්ඩලයට ලැබෙන දිරි දීමනා (වාර්ෂික / මාසික) සහ වෙනත් ප්‍රතිලාභ සඳහා හිමිකම් ඇත.

**වයස** : අවු.18ට නොඅඩු විය යුතු අතර, වයස අවු.45ට නොවැඩි විය යුතු ය.

දැනටමත් සමුපකාර සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

ඉහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් තමා විසින් පිළියෙල කරනු ලබන අයදුම්පත් 2025.02.14 දින දහවල් 12.00ට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ **ගරු සභාපති, සීමාසහිත මොරවක් කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය - කොටපොළ** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම්කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**සී/ස මොරවක් කෝරළේ තේ නි. සමු. සමිතිය, කොටපොළ.**
2025.01.31